## Abstract 20

# අද්‍යතන බෞද්ධ සමාජගත දේව ඇදහිල්ල පිළිබඳ අධ්‍යයනයක්

**පූජ්‍ය. කතරගම උපරතන හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ දර්ශනය),
*katharagamauparathana92@gmail.com*

නූතන බෞද්ධ ජන සමාජය තුළ දේව ඇදහිල්ල ප්‍රබල ලෙස තහවුරුව පවතී. දේව ඇදහීම ප්‍රාථමික යුගයේ සිට පැවත එන අභිචාර විධියකි. බුදුසමය දේවවාදී ආගමක් නොවේ. බුදුසමය දෙවියන් සපුරා ප්‍රතික්ෂේප කළ බවක් එයින් නො හැඟේ. දෙවියන් සිටින බව බුදුසමය පිළිගත්ත ද විමුක්ති සාධනය උදෙසා ඔවුන් සරණ යෑමේ අවශ්‍යතාවක් බුදුසමය නො පිළිගනී. බුදුසමය ලක්දිවට සම්ප්‍රාප්ත වීමට ප්‍රථම මෙරට වැසියන් දෙවියන් සරණ ගොස් සිටි බවට තොරතුරු සඳහන් වේ. ලාංකිකයන් බුදුසමය වැළඳ ගැනීමත් සමඟ ඔවුන්ගේ ලෞකික මෙන් ම ආධ්‍යාත්මික ජීවිතය හැඩ ගැසුණේ බෞද්ධ ඉගැන්වීම්වලට අනුව ය. එහෙත් තම සුපුරුදු දෙවි දේවතාවුන් වෙනුවෙන් පුද පූජා පැවැත්වීමේ පුරුද්ද ඔවුන් ඉදිරියට ම ගෙන ගොස් තිබේ. අද්‍යතන යුගය වන විට ද මෙම තත්ත්වය යම් යම් වෙනස්කම් සහිතව ක්‍රියාත්මක වන අයුරු දැක ගත හැකි ය. බොහෝ විහාරස්ථාන තුළ ද දේවාල ඉදි වී තිබේ. සිංහලයන් බෞද්ධයන් වශයෙන් සිටිය දී ම දෙවියන් වෙනුවෙන් පුද පූජා පැවැත්වීම විමසිය යුතු ම අන්දමේ ගැටලුවකි. ත්‍රිපිටකාගත ඉගැන්වීම් ද පශ්චාත් කාලීන කෘති ද ක්ෂේත්‍ර ගවේෂණ ඇසුරින් ද මෙම ගැටලුව මෙහි දී පර්යේෂණයට ලක් කෙරේ. බෞද්ධයන්ගේ දේව ඇදහීම හා සම්බන්ධ හේතු සාධක පිරික්සීම හා එහි යහපත් අයහපත් ප්‍රතිඵල අනාවරණය මෙමෙ අධ්‍යයනයෙන් අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පද :** අද්‍යතන යුගය, දේව ඇදහීම, පුදපූජා, බුදුදහම, බෞද්ධ සමාජය